www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2005 මැයි දිනය: දෙවන ලෝක සංග්‍රාමය අවසානයේ සිට හැට වසරක්

## May day 2005: Sixty years since the end of world war ii

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2005 මැයි 3**

**දෙවන කොටස**

*පහත පල වන්නේ අප්‍රේල් 30 දින බර්ලින්හි දීත් මැයි 1 දින ලංඩන්හි දීත් පවත්වනු ලැබූ මැයි දින රැස්වීම්වලට ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති හා එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් විසින් ඉදිරිපත් කල වාර්තාවේ දෙවැනි හා අවසාන කොටස ය. පලමු කොටස මැයි 2 වැනි දින පල කරන ලදී.*

හැට වසරකට පෙර ෆැසිස්ට්වාදයෙන් ද, පූර්න යුද්ධයෙන් ද මිදී ලෝකය ඉදිරියට පැමිනි මොහොතේ, දස ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් නැවත එවන් භීෂනයන් සිදු විය නොහැකි අනාගතයක් පිලිබඳ බලාපොරොත්තු දැල්වූහ. නමුදු එවන් ව්‍යසනයක හැකියාව මනුෂ්‍යවර්ගයා වෙලා ගෙන පැතිර යමින් පවතී. දෙවන ලෝක සංග්‍රාමය අවසන් වන විට කම්කරු පන්තිය තුල පැවැති සමාජවාදී අපේක්ෂාවන් ධනවාදය අවසන් කර දැමිය හැකි විප්ලවවාදී පිලිවෙත් බවට පරිවර්තනය කිරීමෙන් ඔවුන් වලකා ලනු ලැබුවේ කුමක් විසින් ද? දිරිසුන් සංශයවාදීන් මහත් උනන්දුවෙන් කියා සිටින (ඔවුන්ගේ ම බෙලෙසුන්කම යුක්තිසහගත කිරීමට වඩාත් සුදුසු) පරිදි කම්කරු පන්තිය තුල විප්ලවවාදී අධිෂ්ඨානය හා ධෛර්යය නොමැති වීම යන්න තුල එයට පිලිතුරු සොයා ගත නොහේ: දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව මෙම ගුනාංගයන් බහුලව පැවතින.

එයට වෙනස් ලෙස පිලිතුර සොයා ගත යුත්තේ පශ්චාත් යුද සමයේ දේශපාලනය හැදෑරීම තුලින් ය. හිට්ලර්ගේ තුන්වැනි රීච්‍ය බිඳ වැටීමෙන් පසු එලැඹුනු තීරනාත්මක අවධිය තුල යුරෝපයේ ධනවාදය පන නල රැක ගත් ප්‍රධාන හේතුව ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවලත් කම්කරු පන්තියේ සංවිධානවලත් ද්‍රෝහිත්වය යි. සෝවියට් සංගමය තුල සෝවියට් නිලධරයේ ඒජන්තයන් ලෙස ක්‍රියා කල කොමියුනිස්ට් පක්ෂ මෙන්ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ ද බටහිර යුරෝපයේ ධනවාදය පෙරලා දැමීමට සහමුලින් ම විරුද්ධ වූහ. ධනේශ්වර ආන්ඩුවල අධිකාර බලය යලි පිහිටුවීමට ධනපති නායකයන් සහ පක්ෂ සමග එක්ව ක්‍රියා කල ස්ටැලින්වාදී නායකයන් විසින් ප්‍රන්සයේ හා ඉතාලියේ දී ප්‍රබල විරෝධතා ව්‍යාපාරයන් නිරායුධ කලහ. මෙ මගින් ස්ටැලින්වාදීන් හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් දුබල යුරෝපීය ධනේශ්වරයටත් එහි ඇමරිකානු රැකවලුන්ටත් යුද්ධයෙන් දැදුරුවී ගිය ආර්ථිකයන් ධනේශ්වර පදනමක යලි ගොඩ නැඟීම භාරගැනීමට අවශ්‍යව තිබූ කාලය සපයා දුන්හ.

ස්ටැලින් විසින් අනුගමනය කල ප්‍රතිපත්තීන් තීරනය වූයේ ඔහු තරයේ ම සතුරු වූ යුරෝපීය හා ජාත්‍යන්තර කම්කරු පන්තියේ අවශ්‍යතාවන් ගෙන් නොව සෝවියට් රාජ්‍යයේ ජාතික අවශ්‍යතාවන් යයි ඔහු සැලකූ දෙයිනි. යුරෝපය තුල විප්ලවය සෝවියට් සංගමය හා එක්සත් ජනපදය අතර ගැටුමක් අවුලුවනු ඇතැයි බියට පත් ස්ටැලින් කම්කරු පන්තියේ බලය සඳහා අරගලය අවමංගත කිරීමටත් අවහිර කිරීමටත් ඔහු සතු සියලු බලතල යොදා ගත්තේ ය. සිවිල් යුද්ධය පැන නැගීම වැලැක් වීමට එවන් අවස්ථාවල දී සෝවියට් නිලධරය සතු බලපෑම නොසෑහෙන බව ප්‍රත්‍යක්ෂ වූ විට ස්ටැලින් කඩාකප්පල් කිරීමේ ක්‍රමය එක විට ම යොදා ගත්තේ ය. ග්‍රීසිය බ්‍රිතාන්‍ය බලවැයික්කියේ කොටසක් ය යන්න තම දෘෂ්ටිය බව වින්ස්ටන් චර්චිල්ට සහතික වෙමින් ස්ටැලින්, ජර්මනියේ ග්‍රහනය බිඳවැටීමෙන් පසුව පැන නැගි සිවිල් යුද්ධයට ග්‍රීක කොමියුනිස්ට් පක්ෂයේ (කේකේඊ) ආධාරය ලැබීම වලක්වනු ලැබී ය. ග්‍රීක සිවිල් යුද්ධය පිලිබඳව ඉතිහාසඥයෙකුගේ වචන මෙසේ විය. ''කේකේඊ පක්ෂයේ පසු පෙල සාමාජිකත්වය මෙන් ම විශේෂයෙන් ම එහි නායකයන් ද නිකමුන් බවට පත් විය. පසුතැවීමක සලකුනුකුදු නොමැතිව ස්ටැලින් ඔවුන් ඔවුන්ගේ ම ඉරනමට අත හැර දැමී ය.'' (1)

යුරෝපීය ධනේශ්වරයටත්, ඇමරිකානු අධිරාජ්‍යවාදයටත් ඉතා තීරනාත්මක වූ හුස්ම ගැනීමේ අවකාශයන් නො සපයා ඇමරිකානු ධනවාදයේ පැවැත්ම රැඳී තිබුනු බටහිර යුරෝපයේ පශ්චාත්-යුද

ප්‍රතිසංවර්ධනය කල නොහැකිව තිබින. මාෂල් සැලැස්ම හඳුන්වා දීම යුද්ධයෙන් දෙවසරක් ඉක්ම ගිය 1967 වන තෙක් කල නොහැකි වූ බව අමතක නො කල යුතු ය. ඒ වන විට, ලෝක යුද්ධාවසානයත් සමග පැමිනි බටහිර යුරෝපයේ විප්ලවවාදී ව්‍යාපාරය කම්කරු පන්තියේ දේශපාලන නායකත්වය විසින් පාවා දෙනු ලැබ පසුබාමින් තිබුනි.

ධනවාදය යලි සමතුලිත කිරීම සඳහා දේශපාලන අවස්ථාව සම්පාදනය කලේ ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නිලධරයේ ප්‍රතිපත්තීන් විසිනි. ජාතික ප්‍රතිසංස්කරනවාදයේ ශක්‍යතාවය පිලිබඳ මිථ්‍යාවන් කම්කරු පන්තිය තුල ශක්තිමත් කිරීම සඳහා ද්‍රව්‍යමය පදනම නිර්මානය කලේ ලෝක ආර්ථිකයේ පසුකාලීන ප්‍රසාරනය විසිනි. 1890 ගනන්වල ප්‍රතිසංස්කරනවාදයේ ''ස්වර්නමය යුගයේ'' පූර්න අවධියේ දී මෙන්ම වේගයෙන් ඉහල නැගි කම්කරු පන්තියේ ජීවන තත්වයන් සරලව ධනවාදය කෙරේ විශ්වාසය පමනක් නොව සමාජ ප්‍රගතියේ උපකරනයක් ලෙස ජාතික රාජ්‍යයේ ශක්‍යතාවය කෙරේ විශ්වාසය ද අභිවර්ධනය කලේ ය.

ජාතිකවාදයේ යලි පිබිදීම ගන්නා ලද සුවිශේෂී රූපාකාරය රැඳී පැවතුනේ එක් හෝ තවත් රටක් මුහුන පෑ සුවිශේෂී දේශපාලන හා අර්ථික රූපාකාරයන් මත ය. උතුරු ඇමරිකාව, යුරෝපය හා ජපානය වැනි දියුනු ධනේශ්වර රටවල දී 1947 පසු සිදු වූ ආර්ථික නැගීම, ජාතික ආර්ථිකයන්හි අනවරත ආර්ථික වර්ධනය, නොකඩවා ඉහල යන ජීවන තත්වයන් සහතික කර දෙනු ඇතැයි ද ධනවාදය සමඟ සම්ප්‍රදායිකව බැඳී ඇත්තාවූ සමාජ දුෂ්ටත්වය අවසානයේදී අහෝසි කරනු ඇතැයි ද යන විශ්වාසය දිරිගැන්වී ය. 1953 ස්ටැලින්ගේ මරනයෙන් පසු වසරවල සෝවියට් ආර්ථිකයේ සීඝ්‍ර වර්ධනය සමාජවාදයට ජාතික මාවතක් යන නිලධරයේ ඉදිරිදර්ශනයට නීත්‍යනුකූලත්වය නයට දුන් බව පෙනීගියේ ය. එම ජාතිකවාදී ඉදිරිදර්ශනයේම ප්‍රභේදයක් චීනය තුල ප්‍රකාශනයක් සොයා ගත් අතර මාවෝ සමාජවාදය මුලුමනින්ම ජාතිකවාදී කොන්දේසි තුල පිලිසිඳු වී ය. ''ආනයන ආදේශනයේ'' ආර්ථික ක්‍රියා මාර්ගය නම් වූ ජාතිකවාදී ඉදිරිදර්ශනයේ තවත් රූපාකාරයකින් ඉන්දියාවේ ධනේශ්වර නායකයන්ගේ ද විජිතකරනයෙන් ස්වාධීන වූ අප්‍රිකාවේ, මැදපෙරදිග හා ආසියාවේ බොහෝ රටවල නායකයන්ගේ ද ප්‍රතිපත්තීන්ට මාර්ගෝපදේශකත්වය සැපයී ය.

දශක දෙකක පමන කාලයක් තිස්සේ විප්ලවාදී සමාජවාදී ජාත්‍යන්තරවාදයට විකල්පයක් ලෙස නව ජාතික නිර්වානයක් සොයාගෙන ඇති බව බොහෝ දෙනෙකුට පෙනීගියේ ය. එහෙත් ධනවාදයේ පශ්චාත් යුද්ධ ප්‍රසාරනයේ අවසානයත් 1970 ගනන් ආරම්භයේ සිට ඉදිරියට ලෝක ආර්ථික අර්බුදයක වැඩෙන සලකුනුත් ජාතික ආර්ථිකයේ අසීමිත වර්ධනයක ශක්‍යතාව පිලිබඳ විශ්වාසය මත පදනම් කල සියලු ප්‍රතිපත්තීන්ට වල කැපීය. ආර්ථික නැග්මේ කාල පරිච්ඡේදය තුල, ජාතික ආර්ථිකයේ සංවර්ධනයට සෘජුව ම ආධාරක වෙමින් ලෝක ආර්ථිකයේ අත්‍යවශ්‍ය බලවේගයන් පසුබිමෙහි නිහඬව ක්‍රියාත්මකව පැවති බව පෙනී ගියේ ය. එහෙත් අර්බුදයේ කොන්දේසි යටතේ භූගෝලීය හා ජාතික ආර්ථික බලවේගයන්ගේ සැබෑ සබඳතාවය ඉතාපැහැදිලිව එලිමහනට පැමිනියේ ය. ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ දැවැන්ත බලයට එරෙහිව කිසිදු රටක කම්කරු පන්තියේ අවශ්‍යතාවන් ආරක්ෂා කිරීමට කිසිදු ජාතික ක්‍රියා මාර්ගයකට, එහි සුවිශේෂ අංග ලක්ෂන කවරක් වුවත්, මාධ්‍යයන් සම්පාදනය කල නොහැකි ය.

1980 ගනන් තුල දී සෝවියට් නිලධරයේ ව්‍යාජ ජාතික සමාජවාදී මානෝරාජිකවාදය බිඳ විසිර ගියේ ය. චීනය සම්බන්ධයෙන් මාවෝවාදී පාලන තන්ත්‍රයේ ස්වභාවය පිලිබඳ දිගු විවාදය තීරනාත්මක විසඳුමකට එලඹියේ ය. 1950 ගනන් මුල දී, ට්‍රොට්ස්කිගේ සම්භාව්‍ය මාක්ස්වාදී සංකල්පයන් නව දේශපාලන වර්ධනයන්ට මුහුනදීමේදී නොසැලෙන බව තෙමේම ඒත්තු ගනිමින් සිටි, අර්නස්ට් මැන්ඩෙල්, මයිකල් පැබ්ලෝ හා අනෙකුත් න්‍යායාචාර්යවරුන් කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන සංවිධානයක් හෝ කම්කරු පන්තිය විසින් බලය අල්ලාගැනීම සඳහා නව විප්ලවවාදී හා මහජන ප්‍රජාතන්ත්‍රවාදී බල සංස්ථා නිර්මානය කිරීම යන දෙකින් එකක් හෝ නොමැතිව සමාජවාදය සාක්ෂාත් කරගැනීමේ හැකියාව පිලිබඳ නිදසුනක් ලෙස චීනය දකගත්හ. කම්කරු පන්තියේ දේශපාලන බලය දරාසිටින අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන්ගෙන් තොර ''කම්කරු රාජ්‍ය'' ලෙස දක්වෙන ''විකෘති'' කම්කරු රාජ්‍ය ලෙස ඔවුන් හැඳින්වූ නව දේශපාලන ප්‍රවර්ගයක් ඔවුහු සොයාගත්හ. මෙම රාජ්‍යයේ පරිනාමය අවසානයේ දී ගෝලීය ධනේශ්වර නිෂ්පාදනයේ දී නැතිවම බැරි පදනමක් බවට චීනය පරිවර්තනය කිරීමට තුඩු දුන්නේ ය. 1949 දී මාවෝසේතුං පිහිටුවූ රාජ්‍යය බොහෝදුරට ''විකෘති ධනේශ්වර රාජ්‍යයක්'' ලෙස වඩාත් නිවැරදිව නිර්වචනය කලහැකිව තිබූ බව අද දින වඩාත් හොඳින් පැහැදිලි වේ.

පසු ගිය සය දශකයෙහි අත්දැකීම්වලින් ඉගෙන ගත හැකි පාඩම නම් ධනවාදය පරාජය කල හැක්කේ ජාත්‍යන්තරවාදයේ පදනම මත පමනක් බවයි. සියලු ජාතිකවාදී විකල්පයන් අපකීර්තියට පත්ව තිබේ. මැයි දිනය සැමරීම එහි මූලාරම්භක අන්තර්ගතය සහිතව ඒ තුලට යලි කාවැද්දිය යුතු අතර එම දිනයේ දී කම්කරු පන්තිය ජාත්‍යන්තරවාදය යලි තහවුරු කලේ සුපිරි ජාතික සහයෝගිතාවයක පොදු ප්‍රකාශනයක අර්ථයෙන් පමනක් නොව එහි දේශපාලන ඉදිරිදර්ශනය හා ක්‍රියා මාර්ගයේ පදනම ද ලෙස ය.

මා ආරම්භ කල තේමාව කරා යලි පැමිනෙමින් මෙම ප්‍රකාශ අවසානයකට ගෙන ඒමට මට ඉඩ

දෙන්න. දෙවැනි ලෝක සංග්‍රාමයේ අවසානය, දරිද්‍රතාවයෙන්, සූරාකෑමෙන් හා හිංසනයෙන් පාරිශුද්ධ වූ ලෝකයක් පිලිබඳව තබා තිබූ බලාපොරොත්තු ද අපේක්ෂාවන් ද සාක්ෂාත් කලේ නැත. සැබැවින්ම සිදු වූයේ දේශපාලන හා බුද්ධිමය වාතාවරනය වඩවඩාත් ප්‍රතිගාමිත්වය දෙසට වර්ධනය වීමයි. පශ්චාත් දෙවැනි ලෝක සංග්‍රාම අවධියේ ඉතිරිව ඇති සමාජ ප්‍රතිසංස්කරන පිසදා හැරීමට පාලක ප්‍රභූව විසින් දරන උත්සාහය, නොවැලැක්විය හැකි පරිදි සියල්ලටම වඩා ආගම මුල් කොටගත් අතිශය ප්‍රතිගාමී දෘෂ්ටිවාදයන් සමග බැඳී තිබේ.

ආගම හා රාජ්‍ය එකිනෙකින් වෙන්ව තබන්නාවූ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ගේ අත්‍යාවශ්‍ය ව්‍යවස්ථාමය කුලුන බිඳ දැමීමට එක්සත් ජනපදයේ දී බුෂ් පාලනාධිකාරය උත්සාහ දරමින් සිටියි. ආගමික ජන සමාජයක දේශපාලන හස්තය ලෙස තෙමේ හැඩගස්වාගැනීමට රිපබ්ලිකන් පක්ෂය උත්සුක වෙයි. ක්‍රිස්තියානි මූලධර්මවාදී පල්ලි හා ඒවායේ සාමාජිකයන් බලමුලු ගැන්වීම මගින් දක්ෂිනාංශික දේශපාලනයේ ජනතා පදනමක් නිර්මානය කිරීමට උත්සාහ දරමින් සිටියි. ඇමරිකානු ජනතාව තුල සිටින අවමංගත වූ දිරිසුන් හා මුග්ධ කොටස් අතර පවා උන්මාදය අවුලුවා ගැනීමට උත්සාහ දරන රිපබ්ලිකානුවන් අසරන ක්‍රිස්තියානින්ට විරුද්ධවාදීකම් කිරීමේ නිරතව සිටින දෙවියන්වහන්සේගේ සතුරන් ලෙස සිය විරුද්ධවාදීන් හංවඩු ගසති.

මෙම උද්ඝෝෂනයේ ෆැසිස්ට්වාදී ස්වභාවය එන්ට එන්ටම පැහැදිලි වෙමින් තිබේ. සිය ලමාවියේ දී ම ජර්මනියෙන් පලා ආ ප්‍රකට ඇමරිකානු ඉතිහාසඥයෙකු වන ෆ්‍රිට්ස් සටර්න්, නාසින් විසින් උපයෝගී කොටගත් උද්ඝෝෂනය හා රිපබ්ලිකන් පක්ෂයේ උද්ඝෝෂනය අතර ඇති සමානකම් ගැන මෑතක දී අවධානය යොමු කලේ ය. ෆොරින් එෆෙයාර්ස් සඟරාවේ අලුත් ම කලාපයෙහි ෆ්‍රිට්ස් ලියා ඇත්තේ ''1930 ගනන්වල ජර්මානු බස කථා කරන සරනගතයන්ට රැකවරනය සැලසූ රට වන එක්සත් ජනපදයේ නුදුරු අනාගතය පිලිබඳව මම සිත්තැවුලට පත්ව සිටිමි.'' යනුවෙනි. නාසින් මහජන සහයෝගය ගොනු කර ගැනීම සඳහා ආගමික ආයාචනයන් යොදාගත් ආකාරය ඔහු සිහිපත් කරයි.

''දෙවියන්වහන්සේ මීට පෙර ද ජාතික දේශපාලනය තුලට ගෙනැවිත් තිබුන ද වාර්ගික ආධානග්‍රාහය ජර්මානු ක්‍රිස්තියානිකමෙන් පුරවාලීමේ දී හිට්ලර් පෙන්වූ සාර්ථකත්වය ඔහුගේ මැතිවරන ව්‍යාපාරවල දී බෙහෙවින් බලගතු මූලයක් විය. සමහර මිනිසුන් ආගම හා දේශපාලනය එකට කවලම් කිරීමේ සදාචාරාත්මක අන්තරාය හඳුනාගත්තද බොහෝ දෙනෙක් එමගින් දූෂනය වෙති. දේශපාලනයේ මායාකාරී ආගමික වේෂධාරීත්වය විශේෂයෙන් ම ප්‍රොතෙස්තානු ප්‍රදේශවල විශාල ලෙස ඔහුගේ ජයග්‍රහනය සහතික කලේ ය.'' (2)

එක්සත් ජනපදයේ බෙහෙවින් කැපී පෙනෙන ඉතිහාසඥයන් අතුරෙන් අයෙක් එවන් අනතුරු ඇඟවීමක් නිකුත්කිරීමට තමන්ට බලකෙරී ඇති බව හඳුනාගැනීම ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ අර්බුදයෙහි ගැඹුර පිලිබඳ ඇඟවීමකි. නාසි ජර්මනිය අභිබවා ජයග්‍රහනය ලැබීමෙන් නවවසරකට පසුව එක්සත් ජනපද ආන්ඩුව ෆැසිස්ට් දෘෂ්ටිවාදය සමග පෙම් කෙලිමින් ෆැසිස්ට් වර්ගයේ ව්‍යාපාරයක වර්ධනය දිරිමත් කරයි.

පාලක ප්‍රභූවේ ඉච්ඡාභංගත්වය හා බංකොලොත්කමට දෙස්දෙන ආගමික පසුගාමිත්වය හා ව්‍යාකුලත්වය මත ධනේශ්වර දේශපාලනය දෘෂ්ටිමය වසයෙන් යැපෙන තත්වය එක්සත් ජනපදයට පමනක් සීමා වූවක් නො වේ. ටෙරී ෂියාවෝ ගේ ජීවිතයේ අවසන් සතිවල එක්සත් ජනපදය තුල පැවති උන්මාදයන් සමගම දෙවැනි ජුවාම් පාවුලු පාප්වරයාගේ මලගම මැදි කරගත් මධ්‍යකාලීන භූත කර්මයේ මධුපානෝත්සවය ද අවසානයේ දී ඔහු ගේ අනුප්‍රාප්තිකයා ලෙස අන්ත ප්‍රතිගාමී රැට්සිංගර් කාදිනල්වරයා අභිෂේක ගැන්වීමද එක්ව පිහිටියේ ය. ජනසංනිවේදනයේ අති නවීන තාක්ෂනික මාධ්‍යයන් උපයෝගී කර ගෙන කැරොල් වොජ්ටිලාගේ මලගමත් රැට්සිංගර්ගේ තේරී පත්වීමත් සම්බන්ධ කරගෙන ලෝකය එකට වෙලාගෙන පැතිර ගිය මාධ්‍ය ආවරනය මට සිහිගැන්වූයේ 1934 දී තමා ලෝර්ඩ්ස් වෙත කල සංචාරය පිලිබඳව ට්‍රොට්ස්කිගේ විස්තරය යි. ''මොන තරම් ගොරහැඩිකමක්, උද්දච්චකමක්, දුෂ්ටකමක් ද!'' ඔහු ලිවී ය. ''ප්‍රාතිහාර්යයන්ගේ සාප්පුවක්, හිත හොඳින් හොර ජාවාරමේ යෙදෙන වෙලඳ සැලක්, එහෙත් සියල්ලට මත් වඩා පාප්වරයාගේ ආශීර්වාදය ලෝර්ඩ්ස් හි ගුවන්විදුලියෙන් ප්‍රචාරය කිරීම. ශුභාරංචියේ තුච්ඡ ප්‍රාතිහාර්යයන් පසෙකින් ගුවන් විදුලි දුරකථනය! රෝමයේ ප්‍රධාන කට්ටඩියාගේ මන්ත්‍රගුරුකම් සමග සාඩම්බර තාක්ෂනයේ එකමුතුව තරම් පිලිකුල් සහගත හා අභූත දෙයක් තවත් තිබිය හැකි ද? සැබැවින්ම මනුෂ්‍ය වර්ගයාගේ චින්තනය එහි ම මලමූත්‍රා ගොඩෙහි එරී දඟලයි.''(3)

අප දැනුවත් කර ඇති පරිදි නව පාප්වරයාවන බෙනඩික්ට්ගේ ආධ්‍යාත්මික ආගමනයේ තීරනාත්මක සිද්ධිය වූයේ ඔහුගේ දේවධර්ම දේශනයන්ට නොහික්මුනු ශිෂ්‍යයන් විසින් බාධා කරනු ලැබූ 1968 සිදුවීම් ය. එම විරෝධතාවන් තුන්වන රීචයේ අපරාධ හා ඒවා ජර්මානු බුද්ධිමය, දේශපාලන හා සමාජ ජීවිතය මත ඇති කල බලපෑම ගැඹුරින් විභාග කිරීමට සැලකිය යුතු තරම් දායක වූවත්, රැට්සිංගර්ට ඒ ගැන උනන්දුවක් නොවී ය. ඔහු මහජන පෙලපාලි ''සම්මතයට'' තර්ජනයක් ලෙස දැකගත් අතර ඒවායින්

ඔහුට ඒත්තු ගැන්වූයේ අනාගමිකවාදයේ ද ප්‍රබුද්ධ චින්තනයේ ද දුෂ්ඨත්වය යි. ''අවසාන වසයෙන් භූගෝලීයකරනය භූගෝලීය අනාගමිකකරනයකට යොමු වී තිබීම වඩා බලගතු තර්ජනාත්මක ප්‍රවනතාවය ලෙස ඔහු සලකන අතර එයට එරෙහිව ප්‍රබල අවධාරනයක් පල්ලිය මගින් යෙදිය යුතු බව නව පාප්වරයා අදහස් කරන'' බව අප්‍රේල් 17 දින නිව් *යෝර්ක් ටයිම්ස්* පත්‍රය වාර්තා කලේ ය.

පල්ලියට වඩාත් ම අන්තරායකාරී තර්ජනය ලෙස බෙනඩික්ට් පාප්වරයා හඳුනාගෙන ඇති ''භූගෝලීය අනාගමිකත්වය'' සාරය වසයෙන් කුමක් ද? ඒ අන් කිසිවක් නොව සමාජය තුල පවතින සමාජවාදයේ හා ජාත්‍යන්තරවාදයේ ජයග්‍රහනයට පදනම දමනු ලබන ආර්ථික විද්‍යාත්මක, සංස්කෘතික හා දේශපාලන ප්‍රවනතාවන් ශක්තිමත් වීම යි. පාප්වරයාගේ බිය ඉතාමත් සාධාරන බව අප පිලිගත යුතු ය. ඓතිහාසික සංවර්ධනයේ දිශාවට දැවැන්ත ලෙස බලපානු ලබන ඉතා ප්‍රබල වෛෂයික බලවේගයන්, ජාතිකවාදය අබිබවා ජාත්‍යන්තරවාදයේ ද, මුග්ධත්වය අබිබවා විද්‍යාත්මක තර්කනයේ ද, ජාතිකත්වය, ආගම හා වර්ගය විසින් නිශ්චය කරනු ලබන කන්ඩායමික අනන්‍යතාව අබිබවා විශ්වීය අනන්‍යතාව ද විජයග්‍රහනයට තුඩු දෙනු ඇත. දෙවන ලෝක සංග්‍රාමය අවසානයේ සිට එය පසු කර ඇති වධවේදනාවන් හා බේදවාචකයන් කොයිහැටි වුවත් සමාජවාදය මුල්බැස ඇත්තේ ආර්ථික හා සමාජ සංවර්ධනයේ වෛෂයික වූ ඓතිහාසික තර්කනය තුල ය. ධනේශ්වර සමාජයේ අර්බුදය, ජාත්‍යන්තර බලවේගයක් ලෙස කම්කරු පන්තිය අරගලයේ මාවතට යලි ගෙන යනු ඇත. මෙම මාවත නොවැලැක්විය හැකි පරිදි ම යොමු වී ඇත්තේ සමාජවාදය කරා ය.

**සටහන්**

1. සී.එම්, වුඩ්හවුස්, *The Struggle for Greece 1941-1949* (ග්‍රීසිය සඳහා අරගලය 1941-1949), චිකාගෝ, 2002, 289 පි.
2. ෆ්‍රිට්ස් ස්ටර්න්, "ජර්මානු ඉතිහාසයෙන් පාඩම්", *ෆොරීන් අෆෙයාර්ස්* (2005 මැයි-ජූනි), 17 පි.
3. ලියොන් ට්‍රොට්ස්කි, *Diary in Exile 1935* (පිටුවාහලේ දිනපොත 1935), නිව් යෝර්ක්, 1963, 93 පි.

© www.wsws.org